# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/1 - 2020 පෙබරවාරි මස 10 වැනි සඳුදා - 2020.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

### පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15 දරන ලිපිනයේ ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්‍ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2020.02.10 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| 1. | වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, | 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. |
| 2. | නගර සභාව | පේදුරුතුඩුව |
| 3. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | යාපනය |
| 4. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වඩමාරච්චි උතුර |
| 5. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් කාර්යාලය, යාපනය |
| 6. | මධ්‍යම පරිසර අධිකාරිය | නො.104, "පරිසර පියස" , කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |


1A - G 031959 — 37 (2020/02)

සැ. යු. - අති විශෙෂ ගැසට් අංක 2161/1 කාණ්ඩය අංක 2161/43 න් අවසන් වේ.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම යෝජිත ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2020.02.10 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය, 4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

දුරකථන අංක : 011-2449754. 011 -2387922. 011 -2449197
ෆැක්ස් අංක : 011 -2438005, 011 -2472623

02-439

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.